# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2245/30 - 2021 සැප්තැම්බර් මස 17 වැනි සිකුරාදා - 2021.09.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන නිවේදන

### කොළඹ මහා නගර සභාව

මහා නගර සභා සම්මත අතුරු ව්‍යවස්ථා

2021 සැප්තැම්බර් මස 06 වැනි දින පවත්වනු ලැබූ කොළඹ මහා නගර සභාවේ මාසික මහා සභා රැස්වීමේ දී, තීරණ අංක 2445 යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරනු ලැබ ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

**එම්. ටී. එම්. ඉක්බාල්,**
නියෝජ්‍ය නගරාධිපති සහ වැඩ බලන නගරාධිපති.

2021 සැප්තැම්බර් මස 17 වැනි දින,
කොළඹ මහ නගර සභාවේ දී ය.

**යෝජනාව**

"1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතෙන් ලැබී ඇති බලතල යටතේ, පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් කටයුතු පිළිබඳ ගරු අමාත්‍යතුමා විසින් කෙටුම්පත් කර 1989 ජනවාරි මස 20 වැනි දින අංක 541/17 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරනු ලැබූ සහ බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් ස්ථිර කරනු ලැබූ බවට 1991 මැයි මස 21 වැනි දින අංක 663/5 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති මහා නගර සභා සම්මත අතුරු ව්‍යවස්ථාවල I වන කොටසේ අතුරු ව්‍යවස්ථා සහ II වන කොටසේ ඇතුළත් -

1. III වන කොටස - මුදල් නියෝග ;
2. V වන කොටස - කොන්ත්‍රාත්තුවලට අදාළ අතුරු ව්‍යවස්ථා ;

යන අතුරු ව්‍යවස්ථා කොළඹ මහා නගර සභාව විසින් පිළිගනු ලැබිය යුතු බවත්, එසේ පිළිගත් සම්මත අතුරු ව්‍යවස්ථා කොළඹ මහා නගර සභා බල ප්‍රදේශය ඇතුළත ක්‍රියාත්මක කළ යුතු බවත් කොළඹ මහා නගර සභාව යෝජනා කරයි."